**කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී උපාධි තෙවන වසර පරීක්ෂණය (අධ්‍යයන ධාරා)**

**පළමු සෙමෙස්තරය 2021 / 2022**

# SLG 3144 - සිංහල සංස්කෘතිය පිළිබඳ හැඳින්වීමක්

(පැ දෙකයි)

ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

01. සංස්කෘතිය පිළිබඳ ව විචාරකයන් විසින් කරන ලද නිර්වචන දෙකක් කෙටියෙන් පැහැදිලි කොට සංස්කෘතියේ පවත්නා ප්‍රධාන මූලිකාංග විස්තර කරන්න.

02. "මහා සංස්කෘතිය තුළ පවත්නා උපසංස්කෘතියේ ප්‍රභේද රාශියකි". සදර්ලන්ඩ් හා මැක්ස්වෙල් යන විචාරක අදහස් ඇසුරින් විමර්ශනයක යෙදෙන්න.

03. මානව සමාජය හා බැඳුණු විවාහ සංස්ථා රැසකි. ඔබ කැමති විවාහ සංස්ථා තුනක් ගෙන එහි පවත්නා විශේෂතා මානව සමාජයේ පැවැත්මට කොතෙක් දුරට බලපාන්නේ දැයි සාකච්ඡා කරන්න.

04. "සංස්කෘතියේ ප්‍රධාන අංගයක් වන භාෂාව මිනිස් සමාජයේ පැවැත්ම ගොඩ නගන්නකි". සිංහල භාෂාවේ ප්‍රභවය සම්බන්ධයෙන් පවතින විවිධ මතභේද විමර්ශනයට බඳුන් කරමින් සිංහල සමාජ ප්‍රගමනයට බලපෑ අයුරු කෙටියෙන් දක්වන්න.

05. "කලාව සංස්කෘතිය හා බැඳුණකි". ගැමි නාටක සම්ප්‍රදායක් වන නාඩගම්වල ලක්ෂණ විමසමින් සමාජ සංස්කෘතිකාංගයක් හැටියට එහි විශේෂතා පෙන්වා දෙන්න.

06. පොදු ජන සාහිත්‍ය නිර්මාණ ඇසුරෙන් සමාජ ජීවිතය කදිමට ප්‍රතිනිර්මාණය වේ. විමර්ශනයක යෙදෙන්න.